" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.
ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 | SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/FIN-AP/03/FI/01 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2023.04.19 |
|---|---|---|---|---|---|

## මුල්‍ය චක්‍රලේඛ 09/2023

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.).

### රාජකාරී විදේශ ගමන් සඳහා විනිමය මුදා හැරීම හා ඒ ආශ්‍රිත වියදම්.

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2023.03.20 දිනැතිව "රාජකාරී විදේශ ගමන් සඳහා විනිමය මුදා හැරීම හා ඒ ආශ්‍රිත වියදම්" සම්බන්ධයෙන් නිකුත් කරන ලිපියෙහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2023.04.06 දිනැති ලිපිය මඟින් ඉහත ලිපියෙහි සඳහන් විධිවිධාන බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.

# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
# MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: MF/06/23/50/2023 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2023.03.20 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, කොමිෂන් සභා සභාපතිවරු,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,
ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළුව සියළුම රාජ්‍ය බැංකු ප්‍රධානීන්,
විශ්ව විද්‍යාල උපකුලපතිවරු , උසස් අධ්‍යාපන ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සමාගම්වල සභාපතිවරුන්

**<u>රාජකාරි විදේශ ගමන් සඳහා විනිමය මුදාහැරීම හා ඒ ආශ්‍රිත වියදම්</u>**

වර්තමානයේ රටේ පවත්නා ආර්ථික හා මූල්‍ය දුෂ්කරතා මත රජයේ අරමුදල් අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා පමණක් ඉතා අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කළ යුතු බැවින්, නිල දූත කාර්යයන් හා රාජකාරි, සාකච්ඡා, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් ඇතුළුව සියළුම රාජකාරි කටයුතු සඳහා විදේශගත වීමේදී ගෙවනු ලබන දීමනා සීමා කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව 2023 මාර්තු මස 20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මු.අ.01/2015/01 චක්‍ර ලේඛයෙහි සඳහන් මතු දැක්වෙන විධි විධාන පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට ගරු ජනාධිපතිතුමා විසින් නියම කර ඇති බව කාරුණිකව දන්වමි.

I. 03 ඡේදය - අනියම් දීමනා ගෙවීම

- 03 (අ) උප ඡේදයෙහි සඳහන් අනියම් වියදම් පියවා ගැනීම සඳහා එක් දිනකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 25 ක් බැගින් උපරිම දින 15 ක් දක්වා අනියම් දීමනා ගෙවිය යුතුය.

- 03(ආ) උප ඡේදයෙහි සඳහන් අනියම් වියදම් පියවා ගැනීම සඳහා එක් දිනකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 40 ක් බැගින් උපරිම දින 10 ක් දක්වා අනියම් දීමනා ගෙවිය යුතුය.

II. 04 ඡේදය - සංයුක්ත දීමනා ගෙවීම

- 04(අ) උප ඡේදයෙහි දැක්වෙන වගුවෙහි දෙවන හා තුන්වන තීරුවල සඳහන් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් වලින් ගෙවනු ලබන දීමනා 30% කින් අඩු කර ගෙවිය යුතුය.

- 04(ඉ) උප ඡේදයෙහි සඳහන් ශිෂ්‍යත්වයක් සඳහා විදේශ රජයන් හෝ ප්‍රදායක ආයතනයන් විසින් අනියම් දීමනා නොගෙවන අවස්ථාවලදී, විදේශගත වන නිලධාරියෙකුට අනියම් වියදම් පියවා ගැනීම සඳහා එක් දිනකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 25 ක් බැගින් උපරිම දින 10 ක් දක්වා අනියම් දීමනා ගෙවිය යුතුය.

III. 05 ඡේදය - සංග්‍රහ දීමනා ගෙවීම

නිල චාරිකාවකදී දූත පිරිසට නායකත්වය දෙන අමාත්‍යවරයා හෝ අමාත්‍යාංශ ලේකම්වරයාට එම චාරිකාවේදී සංග්‍රහ වියදම් දැරීමට සිදු වන්නේ නම්, අදාල රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 750 ක මුදල් ප්‍රතිපාදන ලබා දිය හැකි අතර, අදාළ රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් නොමැති නම්, ගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරනු ලබන නිල දූත පිරිසෙහි නායකත්වය දරන අමාත්‍යවරයාට හෝ ලේකම්වරයාට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 750 ක් සඳහා වූ මුදලක් සංග්‍රහ දීමනා වශයෙන් ගෙවිය හැක.

03. කවද, ප්‍රදායක ආයතනය විසින් පූර්ණ පිරිවැය දරනු නොලබන විදේශ අධ්‍යයන/පුහුණු/සාකච්ඡා/ සම්මන්ත්‍රණ/ සංචාර සඳහා දේශීය අරමුදල් මගින් වියදම් දරමින් රජයේ නිලධාරීන් සහභාගී නොකළ යුතුය.

04. ඉහත 03 හා 04 ඡේදයන්හි සඳහන් විධි විධානවලට අදාළව මීට පෙර නිකුත් කර ඇති චක්‍රලේඛ හෝ උපදෙස් ලිපි වල සඳහන් විධි විධාන 2023 මාර්තු මස 20 වැනි දින සිට බලරහිත වන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

කේ.එම්.මහින්ද සිරිවර්ධන
ලේකම්
මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

පිටපත: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති